# තනතුරු - ඇබෑර්තු

## හක්මණ ප්‍රාදේශීය සභාව

හක්මණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | |
|---|---|---|
| තනතුරු නාමය | - | රියදුරු (දෛනික පදනම) |
| තනතුරු සංඛ්‍යාව | - | 01 |
| රැකියාවේ ස්වභාවය | - | 2025.12.31 දින දක්වා පමණක් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත ලියාපදිංචි කර සේවය ලබා ගනු ලැබේ. ඉන් ඔබ්බට සේවය දීර්ඝ කරනු නොලැබේ. |
| වැටුප් කේතය | - | PL 3 - 2025 |
| වැටුප් ක්‍රමය | - | රු. 42,780.00 - 10 x 490 - 10 x 540 - 10 x 590 - 12 x 630 - රු. 66,540.00 |

01. **බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් :**

1.1 දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් ඕනෑම විෂයයන් 06 ක් සමත් වීම;

1.2 මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රය හා නිපුණත්වය පිළිබඳ සහතිකය ලබා තිබීම;

02. **වයස් සීමාව -** අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.

03. **බඳවා ගැනීමේ පොදු කොන්දේසි :**

3.1 අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය;

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 කාල සීමාව (අනුගාමී වසර 03 ක්) දකුණු පළාත තුළ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය;

3.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය;

3.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියෙන් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතුය.

3.5 සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

04. **සේවා නියුක්ත කරලීමේ කොන්දේසි :**

4.1 සේවා අවශ්‍යතාව අනුව හක්මණ ප්‍රාදේශීය සභාව සතු කැබ්රථ, ට්‍රැක්ටර්, අත්ට්‍රැක්ටර්, ජල බවුසර්, ගලි බවුසර්, ටිපර් රථ කම්පැක්ටරය ආදී ...... රථ වාහනවල රාජකාරී සඳහා යොදවනු ලැබේ.

05. **අයදුම්කළ යුතු ආකාරය :**

5.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2025.08.22 දිනට පෙර සභාපති, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

5.2 අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ "රියදුරු තනතුර සඳහා" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

5.3 අසම්පූර්ණ, අපැහැදිලි අයදුම්පත් හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.4 අයදුම්පත සමඟ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය.-

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික හා නිපුනතා සහතිකය;
3. පදිංචිය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකයය;
4. ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතය;
5. මෑතක දී ලබා ගත් චරිත සහතික 02 ක්.

06. අයදුම්පත් කැඳ වූ පසු හෝ කැඳවන අතරතුරේ දී හෝ බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය සංශෝධනය කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා සතු වේ.

ආර්. එම්. ඩබ්. සෙනෙවිරත්න,
සභාපති,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2025 අගෝස්තු මස 04 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.